සැ. යු. - 2012.05.25 දින පළ වූ අංක 1,760 දරන ගැසට් පත්‍රයේ I-III,III සහ IV (අ) කොටස් පළ නොවීය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,761 - 2012 ජුනි 01 වැනි සිකුරාදා - 2012.06.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 980 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 986 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ජන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


සැ. යු.- ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත 2012 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2012 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2012 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* **පළ වූ දින සිට** තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 ජූනි මස 08 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 මැයි මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## බේරුවල නගර සභාව

බේරුවල නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු පිරවීම සඳහා අදාල අවම සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු ගණන | වැටුප් ක්‍රමය මාසික වැටුප | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | කාර්යාල කම්කරු iii ශ්‍රේණිය | 01 | රු. 11,730-120x10-130x10 - 145x10 - 160 x 12 - රු. 17,600. PL-1-2006(A) 4 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | (අ) 8 වැනි ශ්‍රේණිය/ 9 වසර සමත් වී සිටිය යුතුය. |
| 02 | මාර්ග කම්කරු iii ශ්‍රේණිය | 06 | රු. 11,730-120x10-130x10 - 145x10 - 160 x 12 - රු. 17,600. PL-1-2006(A) 4 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | (ආ) 5 වැනිශ්‍රේණිය/6 වසර සමත් වී තිබිය යුතුය. |
| 03 | සෞඛ්‍ය කම්කරු iii ශ්‍රේණිය | 06 | රු. 11,730-120x10-130x10 - 145x10 - 160 x 12 - රු. 17,600. PL-1-2006(A) 4 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අධ්‍යාපන සුදුසු කම් සලකාබලනු නොලැබේ. |

*බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

(i) අයදුම්කරු ශ්‍රී ලංකික පුරවැසියෙකු විය යුතු ය ;
(ii) අයදුම්කරු බස්නාහිර පළාත තුළ අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර පහක (05) කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය ;
(iii) බේරුවල නගර සභා බල ප්‍රදේශයේ අයදුම්කරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ ;
(iv) අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නෙඅඩු හා 45ට නොවැඩි විය යුතු ය. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩ බල නොපානු ඇත ;
(v) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයෙන් යුක්ත විය යුතුය ;
(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු කරනු ලැබූවකු හෝ රජයේ හෝ පලාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතු යි.;
(vii) සේවා අවශ්‍යතාවය මත විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් සුදුස්සන් තෝරාගනු ලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.
(ii) වැන්දඹු හා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.
(iii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.
(iv) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝග වලටද බස්නාහිර පළාත් සභාව හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බේරුවල නගර සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝග වලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

*අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

(i) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කරගන්නා ලද අයදුම්පත 2012.06.25 දින හෝ එදිනට පෙර ලැබෙනසේ "ලේකම්, බේරුවල නගර සභාව, බේරුවල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(ii) අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අදාල තනතුර සඳහන් කර "............................. තනතුර සඳහා අයදුම්පත්‍රය" යනුවෙන් සඳහන් කර අයදුම්පත එවිය යුතු ය.
(iii) අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය.

*(අ)* උප්පැන්න සහතිකය ;
*(ආ)* අධ්‍යාපන සහතික ;
*(ඇ)* පදිංචිය සහතික කිරීම පිණිස ග්‍රාම නිලධාරි සහතිකය ;
*(ඈ)* මෑතක දී ලබාගත් චරිත සහතික 02ක් ;
*(ඉ)* වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික.

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල මා සතුය.

සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට පමණක් යථා කාලයේ දී සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම් කරනු ලැබේ.

තෝරා ගැනීම සඳහා අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ජන අනුපාතය ද පදනම් කරගනු ඇත.

එච්. එච්. ඉන්ද්‍රා ද සිල්වා,
ලේකම්,

2012 ක් වූ මැයි මස 14 වැනි දින,
බේරුවල,
බේරුවල නගර සභා වේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*බේරුවල නගර සභාව*

**........................................ තනතුර සඳහා අයදුම්පත්‍රය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :——————————.
2. තැපැල් ලිපිනය :——————————.
3. උපන් දිනය : අවුරුද්ද :——————————, මාසය :——————————, දිනය :——————————.
4. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :——————————, මාස :——————————, දින :——————————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.
6. විවාහක/අවිවාහක බව :——————————.
7. ජාතිය :——————————.
8. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? —————— එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන්ද යන වග :——————————.
9. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටපත් අමුණා ඇත)
   (i). සමත්වූ වසර/ශ්‍රේණිය :——————————.
   (ii). අ.පො.ස. (සා.පෙළ) විභාගය :——————————. විභාග අංකය :——————————.
   විභාග වර්ෂය හා මාසය :——————————.
   සමත් වූ විෂයයන් :——————————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9 | |
| 5. | | 10. | |

   (iii). අ.පො.ස. (උ.පෙළ) විභාගය :——————————.
   විභාග අංකය :——————————. විභාග අංකය හා මාසය :——————————.
   සමත්වූ විෂයයන්

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

10. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවය කරන්නේ නම් සේවා විස්තර හා පත්වීමේ ස්වභාවය :
11. සේවා පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම්

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මම සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන ඔබත් පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

**දැනටමත් රජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම ඉල්ලුම්කරු වන ...................................................................... මහතා/මහත්මිය/මෙනෙවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .............................. වශයෙන් සේවය කරයි. ඔහු/ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

...................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
නම : ...........................................................................
පදවි නාමය : ..................................................................
දෙපාර්තමේන්තු/ආයතන (නිල මුද්‍රාව යොදන්න)
දිනය : .................................................

**06-51**

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

## කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව

කොටිකාවත්ත - මුල්ලේරියව ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවාගැනීම සඳහා නියමිත සුදුසුකම ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. (කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන්ට හා දැනටමත් තාවකාලික, අනියම් හා ආදේශක සේවයේ නියුතු අය කෙරෙහි විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.)

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කරන ලද අයදුම්පත් සම්පූර්ණ කර "ලේකම්, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව, ගොතටුව නව නගරය" යන ලිපිනයට 2012.06.15 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු ගණන* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | කාර්යාල කාර්ය සහයක II | 01 | PL-1-2006 A<br>රු. 11,730-10x120-10x130 - 10x145 - 12 x 160 - රු. 17,600<br>7 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අ.පො.ස.(සා.පෙළ) විභාගයේ දී එක් වරක දී කවර හෝ විෂයයන් 06ක් සමත් වී තිබිය යුතුය. |
| 02 | මාර්ග කම්කරු III | 01 | PL-1-2006 A<br>රු. 11,730-10x120-10x130 - 10x145 - 12 x 160 - රු. 17,600<br>4 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අවම වශයෙන් 5 වැනි ශ්‍රේණිය/6 වසර සමත් වී සිටිය යුතුය. |

*02. බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය ;
(ii) අයදුම්කරු බස්නාහිර පළාත තුළ අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර තුනක (03) කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය ;
(iii) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩ බල නොපානු ඇත) ;
(iv) අයදුම්කරු මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතුය ;
(v) සේවා අවශ්‍යතාවය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයන් හා ලිඛිත පරීක්ෂණයන් මගින් සුදුස්සන් තෝරනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.
(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.
(iv) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසි වලටද දෙපාර්තමේන්තු නියෝග වලටද බස්නාහිර පළාත් සභාවේ හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ කොටිකාවත්ත-මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝග වලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

*අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලි සහතික කළ පිටපත් එවිය යුතුය.*

*(1)* උප්පැන්න සහතිකය ;
*(2)* අධ්‍යාපන සහතික ;
*(13* පදිංචිය සනාථ කිරීමේ සහතිකය ;
*(4)* මෑතකදී ලබාගත් ග්‍රාම සේවා සහතිකය ;
*(5)* මෑතකදී ලබාගත් චරිත සහතික 02ක් ;
*(6)* වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික ;
*(7)* සේවා පළපුරුද්ද පිළිබඳ සහතික ;

*04. අයදුම් කළ යුතු ආකාරය :*

(1) මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි (ඒ4 ප්‍රමාණයේ) අයදුම්පත් 2012.06.15 වැනි දිනට පෙර "ලේකම්, කොටිකාවත්ත-මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව, ගොතටුව නව නගරය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
(2) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාල තනතුර සඳහන් කළ යුතුය.
(3) දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශයන් සහිතව එවිය යුතුය.

(4) අතින් ගෙනැවිත් භාරදෙන අයදුම්පත් භාරගනු නොලබන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සැලකිය යුතුයි* :- මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කලාසීමාවේ දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කොට්ටාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

වසන්ති වික්‍රමරත්න,
ලේකම් *(වැ.බ.)*,
කොට්කාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව.

2012 ක් වූ මැයි මස 14 වැනි දින,
ගොතටුව නව නගරය,
කොට්කාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*කොට්කාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව*

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ....................................... තනතුර සඳහා බඳවා ගැනීම***

1. (අ) මුලකුරු සමග නම :——————————.
   (ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————.
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————.
3. ස්ථිර ලිපිනය :——————————.
4. (අ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද ? :——————————.
   (ආ) එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචිවීමෙන් ද? :——————————.
5. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.
6. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.
7. විවාහක/අවිවාහක තත්ත්වය :——————————.
7. දුරකථන අංකය :——————————.
8. උපන් දිනය : වර්ෂය :——————————, මාසය :——————————, දිනය :——————————.
9. 2012.06.15 දිනට වයස ඃ අවුරුදු :——————————, මාස :——————————, දින :——————————.
10. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) :——————————.
11. වෘත්තීය සුදුසුකම් :——————————.
12. සේවා පළපුරුද්ද :——————————.
13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියේ වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද ? :——————————.
14. දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු නම් ඒ පිළිබඳ විස්තර :——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ

මෙම අයදුම්කරු වන ................................................................................ මයා./මිය./මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ......................................................................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක./නොහැක. ඔහු/ඇය මොනයම් ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි./නොකරමි.

——————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :——————————.
පදවි නාමය :——————————.
දෙපාර්තමේන්තුව/ආයතනය :——————————.
(නිල මුද්‍රාව යොදන්න)
දිනය :——————————.

06-85

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

### මීරිගම ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මීරිගම ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත් තුළ ස්ථිර පදිංචි අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර සම්පූර්ණ කර අධ්‍යාපන සහතිකවල පිටපත් සමග "ලේකම්, මීරිගම ප්‍රාදේශීය සභාව, මීරිගම" යන ලිපිනයට 2012.06.25 දිනට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "...................,තනතුර සඳහා ඉල්ලුම්පත" යනුවෙන් සඳහන් කර එවිය යුතුය. අසම්පූර්ණ මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දැනටමත් රජයේ/පළාත් පාලන ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | මාර්ග කම්කරු (කාර්යාල සේවක සේවයේ III ) | 01 | රු. 11,730-10x120-10x130-10x145-12 x 160 - රු. 17,600. (PL-1-2006 ඒ හතර වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | 5 වැනි ශ්‍රේණිය/ 6 වසර සමත්ව තිබීම |
| 02 | සෞඛ්‍ය කම්කරු (කාර්යාල සේවක සේවයේ III ) | 01 | රු. 11,730-10x120-10x130-10x145- 12 x 160 - රු. 17,600. (PL-1-2006 ඒ ) 4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ |
| 03 | කාර්යාල කාර්ය සහායක (කාර්යාල සේවක සේවයේ II ) | 04 | රු. 11,730-10x120-10x130-10x145- 12 x 160 - රු. 17,600. (PL-1-2006 ඒ ) 12 වැනි පියවරේ සිට හතර වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | 8 වැනි ශ්‍රේණිය/9 වසර සමත්ව තිබීම |
| 04 | රියැදුරු (II ආ) | 02 | රු. 12,470-10x130-10x145-10x160- 12 x 170 - රු. 18,860 (PL-3-2006 ඒ හතර වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | සටහන අංක 01 බලන්න. |

***සටහන අංක 01* :-**

රියැදුරු තනතුර සඳහා සම්පූර්ණ කර තිබිය යුතු අධ්‍යාපන, වෙනත් සුදුසුකම් :-

(i) අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය/ 9 වැනි වසර සමත්වී සිටිය යුතුය ;
(ii) පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොන්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකය ලබා සිටිය යුතු ය ;
(iii) වාහන රියැදුරකු වශයෙන් වසර 03ක පළපුරුද්ද තිබිය යුතුය (සහතික මගින් සනාථ කළ යුතුය) ;
(iv) අවම උස අඩි 05ක් විය යුතුය. ;
(v) දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. ;
(vi) මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණය හා මාර්ග නීති පිළිබඳ පරීක්ෂණවලින් අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතුය.

*උපලේඛන අංක 01*

*සේවා කොන්දේසි හා නියමයන් :-*

(අ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(ආ) වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ඇ) තෝරාගනු ලබන්නන් අවුරුදු 03ක පරිවාස කාලයට යටත් වේ. එම කාලය තුළ දී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවය ස්ථිර කරනු ලබයි. දැනටමත් රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත තනතුරු ස්ථිර කළ තැනැත්තන් 01ක වැඩ බැලීමේ කාලයකට යටත් කර බඳවා ගනු ලැබේ.

*02. වෙනත් පොදු කොන්දේසි :*

(අ) අයදුම්පත් කැඳවන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.).
(ආ) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික විය යුතු ය.
(ඇ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය. තෝරා ගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.
(ඈ) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.
(ඉ) අයදුම්පත් කැඳවන දිනය වන විට පූර්වාසන්න වසර 03ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචියක් තිබිය යුතු ය.
(ඊ) රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතු ය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

(අ) මෙම තනතුරු සඳහා ලැබෙන අයදුම්පත් පරීක්ෂා කර බලා සුදුසුකම් ලබන අයදුම්කරුවන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 24/95ට අනුකූලව සම්මුඛ පරීක්ෂණයකට කැඳවීමෙන් තෝරාගනු ලැබේ.

ආර්. පී. සිරිමාන්න,
ලේකම්,
මීරිගම ප්‍රාදේශීය සභාව.

2012 ක් වූ මැයි මස 17 වැනි දින,
මීරිගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ............................. තනතුර සඳහා අයදුම්පත්‍රය***

***මීරිගම ප්‍රාදේශීය සභාව***

1. මුලකුරු සමග නම :——————.
   මුලකුරුවලින් හැඳින්වෙන නම :——————.
2. ස්ථිර ලිපිනය :——————.
3. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————.
4. ජාතික හැඳුනුම්පත් අංකය :——————.
5. උපන් දිනය : අවුරුද්ද :——————, මාසය :——————, දිනය :——————.
6. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :——————, මාස :——————, දින :——————.
7. ස්ත්‍රී/පුරුෂ භාවය :——————. විවාහක/අවිවාහක භාවය :——————
8. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද/ ලියාපදිංචි වීමෙන් ද යන වග :——————.
9. අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

   ඉගෙනගත් පාසැල :——————.

   සමත් උසස්ම විභාගය :——————.

10. (i) වෙනත් සුදුසුකම් :——————.
    (ii) වෘත්තීය සුදුසුකම් :——————.
    (iii) සේවා පළපුරුද්ද :——————.

11. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය හා විස්තර :——————.
    එම පත්වීමේ ස්වභාවය - ස්ථිර/අනියම්/තාවකාලික

12. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?

මෙහි සඳහන් මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වුත් නිවැරදි වුත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

*ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ................................................................................. මයා/මිය/මෙය මෙම ආයතනයේ ..................................................................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ නිත්‍යානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

__________________,
ආයතන ප්‍රධානියා.

අත්සන :__________________.
නම :__________________.
පදවිය :__________________.
දිනය :__________________.

06-161

---

**හොරණ නගර සභාව**

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම - අයදුම්පත් භාරගන්නා දිනය දීර්ඝ කිරීම**

හොරණ නගර සභාවේ තනතුරු පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2012.05.11 දින ගැසට් පත්‍රයේ පළාත් සභා කොටසේ පළකරන ලද නිවේදනය අනුව අදාල අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2012.06.13 දින දක්වා දීර්ඝ කරන ලද බව මෙයින් දන්වමි.

පී. ජී. පී. රුද්‍රිගෝ,
ලේකම්,
නගර සභාව - හොරණ.

2012.05.18 දින,
හොරණ නගර සභා කාර්යාලයේ දී ය.

06-230

---

# පළාත් පාලන නිවේදන

**ගාල්ල මහ නගර සභාව**

මස් වෙළඳසැල් පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීම 2012 වර්ෂය

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් එහි දක්වා ඇති ස්ථානයන්හි 2012 වර්ෂයේ මස් වෙළඳාම කරගෙන යාම සඳහා බලපත්‍ර ලබා ගැනීමට ඉදිරිපත් වී සිටින බව ගෝඝාතක ආඥාපනතේ (272 අධිකාරියේ) 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම බලපත්‍රය නිකුත් කිරීම පිළිබඳව ගාල්ල නගර සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන කාරණයක් සඳහා ද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් 02 කින් යුක්තව එම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව මෙයින් නිවේදනය කරමි.

මෙම කාලසීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරුද්ධතාවයක් ඉදිරිපත් නොවුවහොත් මෙහි උපලේඛනයේ සඳහන් ඉල්ලුම්කරුවන් සඳහා මස් වෙළඳාම කරගෙන යාම සඳහා බලපත්‍ර ලබාදීම කරන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

**උපලේඛනය**

| | *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *වෙළඳාම කරන ස්ථානය* | *වෙළඳාමේ ස්වභාවය* |
|---|---|---|---|
| 1. | මොහොමඩ් අතික් සයිප්‍රල්ලාහ්<br>අංක 41/48, පැළවත්ත, රිච්මන්ඩ් කන්ද පාර,<br>ගාල්ල. | කෝන්ගහහන්දිය ගවමස් කඩය | ගවමස් |
| 2. | මොහොමඩ් නසීර් ශාවුල් හමීඩ්<br>අංක 28/9සී, බණ්ඩාරනායක මාවත, ගාල්ල | ඔරොප්පුවත්ත මධ්‍යම වෙළඳපොල<br>අංක 37, එළුමස් වෙළඳසැල | එළුමස් |
| 3. | නුරුල් මින්නා මෂූර්<br>දෙවට ගවමස් වෙළඳසැල<br>අංක 546, මාතර පාර, කටුගොඩ, ගාල්ල. | ගවමස් | |

මෙත්සිරි ද සිල්වා,
නගරාධිපති,
මහ නගර සභාව - ගාල්ල.

2012 මැයි මස 16 වැනි දින,
ගාල්ල මහ නගර සභා කාර්යාලයේ දී ය.

06-179/1

## ගාල්ල මහ නගර සභාව

ගෝසාතක ආඥාපනතේ (272 වැනි අධිකාරිය) 17(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ගාල්ල මහ නගර සභාවේ නගරාධිපති මෙත්සිරි ද සිල්වා වන මා විසින් 2012 වර්ෂය තුළ මෙහි පහත උපලේඛනයට අනුව එහි සඳහන් දිනයන්හි දී සහ රජය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන දිනයන්, මා විසින් විටින් විට නිකුත් කරනු ලබන නියෝග අනුව වැසිය යුතු දිනයන්හිදී ද, ගාල්ල මහ නගර සභා බල ප්‍රදේශය තුළ මස් පිණිස සතුන් මැරීම, මස් විකිණීම, මස් විකිණීම පිණිස ප්‍රදර්ශනය කර තැබීම හා මස් වර්ග විකුණනු ලබන ස්ථාන විවෘත කර තැබීම සපුරා තහනම් බව මෙයින් නිවේදනය කරමි.

මෙත්සිරි ද සිල්වා,
නගරාධිපති,
මහ නගර සභාව - ගාල්ල.

2012 මැයි මස 16 වැනි දින,
ගාල්ල මහ නගර සභා කාර්යාලයේ දී ය.

| | |
|---|---|
| 2012 ජනවාරි 08 | දුරුතු මස පුර පසළොස්වක පෝය දිනය |
| 2012 ජනවාරි 15 | දෙමළ තෛයිපොංගල් දිනය |
| 2012 පෙබරවාරි 04 | ජාතික දිනය |
| 2012 පෙබරවාරි 07 | නවම් පුර පසළෝසවක පෝය දිනය |
| 2012 පෙබරවාරි 20 | මහා ශිව රාත්‍රී දිනය |
| 2012 මාර්තු 07 | මැදින් පුර පසළොස්වක පෝය දිනය |
| 2012 අප්‍රේල් 06 | බක් පුර පසළොස්වක පෝය දිනය, මහ සිකුරාදා |
| 2012 අප්‍රේල් 12 | සිංහල හා දෙමළ අවුරුදු දිනට පෙර දිනය |
| 2012 අප්‍රේල් 13 | සිහල හා දෙමළ අලුත් අවුරුදු දිනය |
| 2012 මැයි 01 | මැයි දිනය |
| 2012 මැයි 05 | වෙසක් පුර පසළොස්වක පෝය දිනය |
| 2012 මැයි 06 | වෙසක් පුර පසළොස්වක පෝය දිනට පසු දිනය |
| 2012 ජූනි 04 | පොසොන් පුර පසළොස්වක පෝය දිනය |
| 2012 ජූලි 03 | ඇසල පුර පසළොස්වක පෝය දිනය |
| 2012 අගෝස්තු 01 | නිකිණි පුර පසළොස්වක පෝය දිනය |
| 2012 සැප්තැම්බර් 29 | බිනර පුර පසළොස්වක පෝය දිනය |
| 2012 ඔක්තෝබර් 04 | ලෝක සත්ව දිනය |
| 2012 ඔක්තෝබර් 29 | වප් පුර පසළොස්වක පෝය දිනය |
| 2012 නොවැම්බර් 13 | දීපවාලී උත්සව දිනය |
| 2012 නොවැම්බර් 27 | ඉල්පුර පසළොස්වක පෝය දිනය |
| 2012 දෙසැම්බර් 27 | උඳුවප් පුර පසළොස්වක පෝය දිනය |

06-179/2

---

## කටුනායක - සීදුව නගර සභාව

### නගර සභා සීමාව තුළ වාහන නවතා තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ වාහනවලින් ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පාලත් පාලන විෂය භාර ගරු අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා විසින් සම්පාදනය කර 2011 සැප්තැම්බර් මස 29 වැනි දින අංක 1725/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට්* පත්‍රයේ පළකර ඇති ඉහත කී අතුරු ව්‍යවස්ථාව කටුනායක - සීදුව නගර සභාවට පිළිගෙන වැළඳ ගැනීමට සුදුසු බවට 2012 පෙබරවාරි මස 28 වැනි දින නගර සභා මාසික රැස්වීමේදී සභා සම්මත කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ලලන්ත ගුණසේකර,
ගරු සභාපති,

2012 පෙබරවාරි මස 28 වැනි දින,
කටුනායක සීදුව නගර සභාවේ දී ය.

06-52

## දොම්පේ ප්‍රාදේශීය සභාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදනු ලැබ 2005.02.18 දිනැති අංක 1381 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පලකරන ලද මහජන පුස්තකාල අතුරු වයවස්ථාව දොම්පෙ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බලාත්මකව ක්‍රියාත්මක කිරීමට 2011.11.29 වැනි දින පැවති මහා සභාවේදී ඒකමතිකව සභා සම්මත වූ බව ද මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවන දින සිට එකී අතුරු ව්‍යවස්ථාව දොම්පෙ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බලාත්මකව ක්‍රියාත්මක වන බව ද මෙයින් දැනුම් දෙමි.

මිලාන් ජයතිලක,
සභාපති,
දොම්පෙ ප්‍රාදේශීය සභාව.

2012 ජනවාරි මස 30 වැනි දින,
කිරිඳිවැල,
ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

06-26

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

**(ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

*(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය.)*

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | *පිටපතක මිළ* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2012** | | | |
| ජුනි | 2012.06.01 | සිකුරාදා | 2012.05.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.06.08 | සිකුරාදා | 2012.05.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.06.15 | සිකුරාදා | 2012.06.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.06.22 | සිකුරාදා | 2012.06.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.06.29 | සිකුරාදා | 2012.06.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2012.07.06 | සිකුරාදා | 2012.06.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.07.13 | සිකුරාදා | 2012.06.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.07.20 | සිකුරාදා | 2012.07.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.07.27 | සිකුරාදා | 2012.07.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2012.08.03 | සිකුරාදා | 2012.07.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.08.10 | සිකුරාදා | 2012.07.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.08.17 | සිකුරාදා | 2012.08.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.08.24 | සිකුරාදා | 2012.08.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.08.30 | බ්‍රහස්පතින්දා | 2012.08.17 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.